www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ඉස්ලාම් II
இஸ்லாம் II
Islam II

44 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

✻ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ඉස්ලාම් යන්නෙහි අර්ථය කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) ඉස්ලාම්හි විශේෂ අංග **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) ඉස්ලාම්හි පදනම් මූලාශ්‍රයන් සඳහන් කොට එයින් **එකක්** විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iv) රිසාලත්, හිදායත් ලබාගැනීමේ මාධ්‍යයක් වන බව නබිවරුන්ගේ ඉතිහාසය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

**2.** (i) ඉජ්තිහාද්වලට අල්-කුර්ආන්හි සඳහන් කර ඇති මූලාශ්‍රයන්ගෙන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි.)

(ii) පරස්පර අදහස් තිබෙන විටක දී රැකගත යුතු, ඉස්ලාම් අවධාරණය කර ඇති පිළිවෙත් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) 'කෞලුස් සහාබි' යන්න පැහැදිලි කොට, එය නීති මූලාශ්‍රයක් ලෙස පිළිගැනීමට සාධාරණ හේතු **දෙකක්** හා ප්‍රතික්ෂේප කිරීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

(iv) මුස්ලිම්වරයකුගේ ගෘහ ජීවිතය, ගෘහයේ භෞතික පිහිටීම හා භෞතික පරිසරය පිළිබඳ ඉස්ලාමික මගපෙන්වීම්වලින් **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08 යි.)

**3.** (i) 'ඉබාදත්' යනු කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) zසකාත් ලබාදෙන්නාට ලැබෙන ප්‍රයෝජන **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) හජ් හි අධ්‍යාත්මික හා ලෞකික ප්‍රයෝජන එකකට **තුන** බැගින් සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

(iv) ඉස්ලාම් හි මූලික යුතුකම් හා අහ්ලාක් අතර පවතින සබඳතාවය සාධක සහිතව විස්තර කරන්න. (ලකුණු 08 යි.)

## II කොටස

**4.** (i) ඉස්ලාම්හි ෂරීආ ගැන සඳහන් කොට, දීන් හා ෂරීආ අතර පවතින වෙනස්කම් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

(ii) විශ්වය, මිනිසා හා ජීවිතය පිළිබඳව ඉස්ලාමික දෘෂ්ටිකෝණය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**5.** (i) ඉස්ලාම් අනුමත කළ වෙළඳ ක්‍රම **හතරක්** ගැන සඳහන් කොට, වෙළඳාම සඳහා වූ කොන්දේසි විස්තර කරන්න. (ලකුණු 10 යි.)

(ii) කර්මාන්තවලට ඉස්ලාම්හි ලබා දී ඇති වැදගත්කම නබිවරුන්ගේ ඉතිහාසය හා සම්බන්ධ කර විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**6.** (i) සුබසාධනය පවත්වාගැනීම පිළිබඳ ඉස්ලාමීය මතය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ii) ඉස්ලාම් ලබා දී ඇති ස්ත්‍රී පුරුෂ සමානතාවයෙහි ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට ගෙන ඇති ක්‍රමවේද **පහක්** විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**7.** (i) 'අල්-ඉල්හාද්' යන්න අර්ථ දක්වා එහි බිහිවීම, වර්ධනය හා ඉස්ලාම් ලෝකයට එයින් ඇති වූ බලපෑම් ගැන විස්තර කරන්න. (ලකුණු 10 යි.)

(ii) මුස්ලිම්වරයකුගේ දෛනික ක්‍රියාකාරකම්වල දී හුකුකුල්ලාහ්, හුකුකුල් ඉබාද් ගැන විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**8.** පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගෙන් වෛද්‍ය ක්ෂේත්‍රයට සිදු වූ දායකත්වය (ලකුණු 05 යි.)

(ii) කර්දුල් හසන් (ලකුණු 05 යි.)

(iii) ඉස්ලාම්හි ඉගැන්වීම් අනුව දෙමව්පියන් කෙරෙහි දරුවන්ගේ යුතුකම් (ලකුණු 05 යි.)

(iv) ප්‍රවේනි උරුම නීතියෙහි අල්-හජ්බ් (ලකුණු 05 යි.)

***

www.alevelapi.com